සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 05

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	
	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	
	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.07.21. පෙ.ව. 10.30 සිට පෙ.ව. 11.30 *[දෙවැනි පිටුව බලන්න.*

01. පහත රූප දෙක හොඳින් බලන්න. A රූපයට වඩා B රූපයේ වෙනස්කම් ගණන කීය ද?

A රූපය 

B රූපය 

1. 3 2. 4 3. 5

02. පහත මල් පෝච්චි හතරක රූප පහක් පහත දැක් වේ. ඒවා අතුරෙන් එකම මල් පෝච්චි දැක්වෙන් රූප දෙක මොනවා ද?



A B C D E

1. A හා C 2. B හා D 3. C හා E

03. මුලින් දී ඇති රූපය සකස් කිරීම සඳහා A , B, C , D රූප කොටස් අතුරෙන් කුමන කොටස් දෙක යොදා ගත යුතු ද?



A B C D


1. A හා B 2. B හා D 3. A හා B

04. මෙම කවියෙන් කියැවෙන අදහස සමග වඩාත් හොඳින් ගැළපෙන්නේ,

උදැසන ම ලොව සිනාසෙයි
මල් පෙති මදක් විවරවෙයි
සීතල කෙමෙන් ඈතට යයි
ඇස් දෙක ඇර ලොවම බලයි

1. හඳ එළිය 2. හිරුඑළිය 3. සුළඟ

05. පහතින් දැක්වෙන්නේ A සහ B ලෙස නම් කර ඇති ජල භාජන දෙකකි. ඉන් වැඩිපුර ජල ප්‍රමාණය ඇති A භාජනයෙන් B භාජනයට ජලය 450ml ක ප්‍රමාණයක් දැමූ විට භාජන දෙකේ ම ජල ප්‍රමාණය සමාන වූයේ නම් භාජන දෙකේ මුලින් ම තිබූ ජල ප්‍රමාණ අතර වෙනස කීය ද?




1. 900 ml 2. 450 ml 3. 500 ml

06. ගුවනි උදෑසන මිදුලට ගොස් වාමාවර්තව සම්පූර්ණ වට හතරක් හා වට තුන්කාලක් කරකැවී නැවතුන විට ඇයගේ සෙවණැල්ල ඉදිරියෙන් වැටී තිබුණි නම් ඇය මුලින් ම හැරී සිටි දිශාවට අනුව සිටීමේ දී ඇයගේ වම් අත පැත්තේ ඇති දිශාව කුමක් ද?


1. උතුර 2. බටහිර 3. නැගෙනහිර

07. රූපයේ දැක්වෙන පෙට්ටියේ රිබන් පටි දෙකක් යොදාගෙන තදින් ගැට ගසා ඇත. ගැටය සඳහා එක් රිබන් පටියකින් 10 cm බැගින් වැඩිපුර තබා ඇත. ඒ අනුව පෙට්ටිය වටා ඇති රිබන් පටි දෙකෙහි මුළු දිග කොපමණ ද?



1. 106 cm
2. 132 cm
3. 122 cm

08. පහත දැක්වෙන්නේ පැති තුන ම සමාන ත්‍රිකෝණයක් තුළ ඇඳ ඇති පාද තුන ම සමාන ත්‍රිකෝණයකි. එම ත්‍රිකෝණය ලබා ගැනීමට A හා B තිරස් රේඛාවක් ඇඳ ඇත. ලොකු ත්‍රිකෝණය තුළ A , B රේඛාව මෙන් තිරස් රේඛා පහළට තවත් 3 ක් ඇඳ ඒ තුළ රූපයේ දක්වා ඇති ප්‍රමාණයේ කුඩා ත්‍රිකෝණ ඇන්දේ නම් එම ලොකු ත්‍රිකෝණය තුළ අපට නිර්මාණය කර ගත හැකි මුළු ත්‍රිකෝණ ගණන කීය ද?



1. 36
2. 16
3. 25

09. ගුරුතුමා තම පන්තියේ ශිෂ්‍යයන්ට මෙසේ පැවසීය.

''ඔමිඳු අන් සැමට ම වඩා උස ශිෂ්‍යයා ය, නමුත් ඔහු මිටි ම ශිෂ්‍යයාට වඩා උස නැත.'' මෙයින් පැහැදිලි වන්නේ,

1. ගුරුතුමා වැරදි ප්‍රකාශයක් කර ඇත. 2. සියලු ශිෂ්‍යයන් එක ම උසය.
3. උස ම ශිෂ්‍යයින් දෙදෙනෙකි.

10. කළු ලේන්සු 4ක්, සුදු ලේන්සු 5ක් සහ රතු ලේන්සු 6ක් ලාච්චුවක දමා ඇත. ලාච්චුව දෙස නොබලා, වරකට එක් ලේන්සුව බැගින් ඉවතට ගන්නේ නම් එක ම පාටින් යුත් ලේන්සු දෙකක් (යුගලයක්) අනිවාර්යයෙන් ම ලබා ගැනීමට නම් අව ම වශයෙන් ලේන්සු කීයක් එළියට ගත යුතු ද?

1. 3ක් 2. 4ක් 3. 7ක්

11. අම්මාගේ වයස දුවගේ වයස මෙන් සිව්ගුණයකි. තව වසර 5කට පසු ඔවුන් දෙදෙනාගේ වයස්වල එකතුව අවුරුදු 50ක් වේ නම්, දුවගේ වර්තමාන වයස කීයද?

1. වයස අවුරුදු 8කි 2. වයස අවුරුදු 10කි 3. වයස අවුරුදු 12කි

12. සමාන ප්‍රමාණයේ බෝතල් 3ක ඇති වතුර ප්‍රමාණයෙන් බාල්දියක් සම්පූර්ණයෙන් පිරවිය හැකි ය. බෝතලයක් පිරවීමට කොප්ප 4ක වතුර අවශ්‍ය වේ. එසේ නම් එවැනි බාල්දි 2ක් සම්පූර්ණයෙන් පිරවීමට අවශ්‍ය වන මුළු කෝප්ප ගණන කොපමණ ද?

1. 12 2. 24 3. 36

13. ගෙම්බෙක් අඩි 10ක් ගැඹුරු ළිඳකින් උඩට ඒමට උත්සාහ කරයි. ඌ සෑම දිනක ම උදෑසනට අඩි 3ක් ඉහළට පනින අතර රාත්‍රියේ දී අඩි 1ක් පහළට ලිස්සා වැටේ. මෙම ගෙම්බාට ළිඳෙන් ගොඩ ඒමට දින කීයක් ගතවේද?

1. දින 5 2. දින 6 3. දින 7

14. සමාන පෙනුමක් ඇති රන් කාසි 9ක් තිබේ. මෙයින් එකක් පමණක් බරින් අඩු ව්‍යාජ කාසියකි. පඩි නැති තැටි තරාදියක් භාවිත කර, බරින් අඩු ව්‍යාජ කාසිය අනිවාර්යයෙන් ම සොයා ගැනීමට නම් අව ම වශයෙන් තරාදිය කී වතාවක් භාවිත කළ යුතු ද?

1. 2 වතාවක් 2. 3 වතාවක් 3. 4 වතාවක්

✷ **අමල් , විමල් , කමල් සහ නිමල් යනු මිතුරන් සිව්දෙනෙකි. ඔවුහු කුරුවිට, ඇහැළියගොඩ, රත්නපුර සහ පුස්සැල්ල යන ප්‍රදේශවල ජීවත් වෙති. (පිළිවෙළින් නොවේ) ඔවුහු චෙස් , ක්‍රිකට්, පිහිනුම් සහ පාපන්දු යන ක්‍රීඩාවලින් එකකට හෝ කිහිපයකට ප්‍රිය කරති.**

- **අමල් ජීවත් වන්නේ ඇහැළියගොඩ හෝ රත්නපුර ප්‍රදේශවල නොවේ.**
- **කමල් ක්‍රිකට් හෝ පිහිනුම් ක්‍රීඩාවට කැමති ය.**
- **විමල් කුරුවිට ප්‍රදේශයේ ජීවත් වන අතර ඔහු පිහිනුම් ක්‍රීඩාවට කැමති නැත.**
- **නිමල් රත්නපුර ප්‍රදේශයේ ජීවත් වන අතර ඔහු ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් කැමති ය.**
- **පුස්සැල්ල ප්‍රදේශයේ ජීවත් වන පුද්ගලයා ක්‍රීඩා හතරට ම කැමති ය.**


15. ඒ අනුව, අමල් ජීවත් වන ප්‍රදේශය කුමක් විය හැකි ද?

1. ඇහැළියගොඩ 2. කුරුවිට 3. පුස්සැල්ල

16. මිතුරන් සිව්දෙනා ම කැමති ක්‍රීඩාව කුමක් විය හැකි ද?

1. ක්‍රිකට් 2. පිහිනුම් 3. චෙස්

17. ලීටර 8 ක ධාරිතාවක් ඇති සිලින්ඩරාකාර ටැංකියක උපරි ම උසට ජලය පුරවා ඇත. මෙම ටැංකියේ පතුල මට්ටම හා උසින් හරි අඩක් ප්‍රමාණයෙන් එක ම තරමේ සිදුරු 2 ක් ඇත. ඒවායෙන් එක ම වේගයෙන් තත්පරයකට මිලිලීටර 50 බැගින් ජලය ඉවතට යයි. ටැංකිය සම්පූර්ණයෙන් ම හිස්වීමට ගතවන කාලය කොපමණ ද?



1. මිනිත්තු 60
2. මිනිත්තු 1 තත්පර 20
3. මිනිත්තු 2

18. හිස්තැනට ගැළපෙන සංඛ්‍යාංකය තෝරන්න.


vii	viii	ix
ix	vii	v
x	....	viii

1. xi
2. viii
3. ix

19. ළමයින් පස්දෙනෙක් රතු, නිල්, කොළ, කහ සහ සුදු යන පාටවලින් යුත් කමිස හැඳ එක පෙළට වාඩි වී සිටිති. කහ කමිසය හැඳි ළමයා සිටින්නේ පේළියේ කෙළවරක නොවේ. නිල් කමිසය හැඳි ළමයා, කොළ කමිසය හැඳි ළමයාට සෘජුවම වම් පසින් සිටී. රතු කමිසය හැඳි ළමයා සහ සුදු කමිසය හැඳි ළමයා පේළියේ දෙකෙළවරම වාඩි වී සිටී. එසේ නම්, පේළියේ කෙළින්ම මැද (තුන්වන ස්ථානයේ) වාඩි වී සිටින්නේ කුමන වර්ණයේ කමිසය හැඳි ළමයාද?

1. කහ
2. නිල්
3. කොළ

✷ **රූප සටහන සම්බන්ධව ඇති පහත විස්තරය හොඳින් කියවන්න.**

20. 


මෙම රූප සටහනේ කැරට් වගා කර ඇති කොටස් 2 කි. ඒවා එක ළඟ වගා කර නොමැත. සෑම කැරට් වගා කළ භූමියක් ඉදිරිපිට ම ඇත්තේ ගෝවා වගා කළ භූමියෙකි. 1 ත් 4 ත් අතර ඇති ඔත්තේ සංඛ්‍යාව සහිත භූමිය තුළ රාබු වගා කර ඇත. සෑම ගෝවා වගා කළ කොටසක් දෙපස ම ඇත්තේ ලීක්ස් වගා කළ තීරුවයි. මේ අනුව ලීක්ස් වගා කළ භූමිවලට පමණක් හිමි අංකය වන්නේ,

1. 1 , 3 , 5
2. 1 , 5 , 7
3. 7 , 1 , 3

21. බල්බ වැලක පළමු බල්බය රතු පාට ය. ඊළඟ බල්බ පිළිවෙළින් දම් , කහ , සුදු , තැඹිලි බල්බ වේ. මෙම බල්බ වැලේ 12 වෙනි රතු බල්බය අවසන් බල්බය වේ නම්, බල්බ් වැලේ ඇති මුළු බල්බ් ගණන කීය ද?

1. 55
2. 56
3. 59

22. එක් එක් තරාදිවල ඇති ද්‍රව්‍ය සහ ඒවායේ බර නිරීක්ෂණය කර තුන්වන තරාදියේ ඇති ද්‍රව්‍ය වල බර නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.



1. 15 kg
2. 12 kg
3. 18 kg

23. සෘජුකෝණාස්‍රාකාර ඉඩමක් මුළුමනින් ම ආවරණය වන පරිදි යාබද පේළි දෙක අතර යාබද තීර දෙකක් අතර පරතරය 3m ක් බැගින් වන පරිදිත් ඉඩමේ පැළ 35 ක් සිටුවා ඇත. එම පැළ සිටුවා ඇති සීමාවේ සිට ඉඩමේ මායිම තෙක් 2m ක් පළල පාරක් ද ඉඩම වටේට ම ඇත. ඉඩමේ පළල කොපමණ ද?

1. 13 m
2. 16 m
3. 14 m

PAST PAPERS WIKI

24. ළමයින් 68 දෙනෙක් සිටින පන්තියක ගැහැනු ළමයින් 8 දෙනා බැගින් ද පිරිමි ළමයි 5 දෙනා බැගින් ද වෙන් වෙන් ව කණ්ඩායම්ගත කළ විට පන්තියේ සියලු ම දරුවන් කණ්ඩායම් ගත වේ නම් ගැහැනු ළමයින්ගේ කණ්ඩායමේ කීයක් තිබේ ද?

1. 4 2. 5 3. 6


25. තෑගි පාර්සලයක් පහත දැක්වෙන පරිදි ද්‍රව්‍ය තුනක් අඩංගු වන සේ සකස් කෙරේ.

- චිත්‍ර පොතක් හෝ පාට පෙට්ටියක්
- පෑනක් හෝ පැන්සලක්
- පැන්සල් පෙට්ටියක් හෝ පාට පෙට්ටියක්.

මේ අනුව එකිනෙකට වෙනස් වන පරිදි ආකාර කීයකට තෑගි පාර්සල් කළ හැකි ද?

1. 6 2. 8 3. 9

- නුවන්ති ඇගේ සැමියා , මව , පියා , පුතා , දුව , බෑණා , මුණුපුරා , මිණිපිරී , සහෝදරයා සහ ඔහුගේ බිරිඳ අතර සම්බන්ධය පහත සටහනකින් ඇඳ තිබුණි. ඒ ඇසුරින් 26 හා 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



26. නුවන්තිගේ දුව සහ බෑණා දැක්වෙන අක්ෂර කණ්ඩය වන්නේ,

1. R + S 2. T + U 3. V + W

27. සටහනට අනුව x යනු y හා z ගේ කවුරුන් විය හැකි ද?

1. මාමා 2. මහප්පා 3. බාප්පා

28. නයනා ළඟ රුපියල් 80 ක් තිබූ අතර දිලානි ළඟ රුපියල් 60 ක් තිබුණි. නයනා ඇගේ ළඟ තිබූ මුදලින් රුපියල් 40 ක් දිලානිට දුන් අතර දිලානි ළඟ තිබූ මුදලින් රුපියල් 30 ක් නයනාට දෙන ලදී. දැන් නයනා ළඟ ඇති මුදල දිලානි ළඟ ඇති මුදලට,

1. සමාන ය 2. වඩා අඩු ය 2. වඩා වැඩි ය

29. වෙළෙන්දෙක් මිල දී ගත් දොඩම් සංඛ්‍යාවක් හා ඒවා අලෙවි කළ ආකාරය පිළිබඳ විස්තරයක් පහත දැක් වේ.

- දොඩම් ගෙඩියක් රුපියල් 12 බැගින් දොඩම් ගෙඩි 50 ක් මිලට ගත්තේ ය.
- එම ගොඩින් දොඩම් ගෙඩි 8 ක් නරක් වී තිබූ නිසා ඒවා ඉවත් කරන ලදී.
- එක් දොඩම් ගෙඩියක් රුපියල් 20 බැගින් අලෙවි කළේ ය.

ඉහත විස්තරය අනුව දොඩම් ගෙඩි විකිණීමෙන් ඔහු / ඇය ලැබූ ලාභය කොපමණ ද?

1. රු. 240.00 2. රු. 280.00 3. රු. 310.00

30. පහත සඳහන් සංවාදය අනුපිළිවෙළින් නිවැරදිව දැක්වෙන අවස්ථාව වන්නේ,

P - එහෙනම් ඔයාගේ අතේ පෑන තියෙන්නේ ඇයි ?

Q – අපට පෑනෙන් ලියන්න එපා කියලා ගුරුතුමිය කීවා නේ ද?

R – මම ඔයාට පැන්සලක් දෙන්නම්

S – ඔව්, අකුරු කැතවෙන නිසා පැන්සලෙන් ලියන්නැයි ගුරුතුමිය කීවා.


T – මට අද පැන්සල ගේන්න අමතක උනා

1. TSPRQ 2. QSPTR 3. QPSRT

31. නිවාසාන්තර ක්‍රීඩා තරගයක දී ගැමුණු නිවාසය තිස්ස නිවාසයට වඩා වැඩියෙන් ලකුණු ලබා ගෙන තිබුණ ද විජය නිවාසයට වඩා අඩුවෙන් ලකුණු ලබා තිබුණි. එසේ නම් මෙම තරගයේ දී පළමු, දෙවෙනි හා තුන්වෙනි ස්ථාන ලබා ගත් නිවාස අනුපිළිවෙළින්

1. ගැමුණු , තිස්ස , විජය 2. විජය, තිස්ස,ගැමුණු 3. විජය, ගැමුණු, තිස්ස

32. පහත රූපයේ ඇති සෘජුකෝණාස්‍ර සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.



1. සෘජුකෝණාස්‍ර සහ සමචතුරස්‍ර ගණන සමාන ය.
2. සෘජුකෝණාස්‍ර ගණනට වඩා සමචතුරස්‍ර ගණන වැඩි ය
3. සමචතුරස්‍ර ගණනට වඩා සෘජුකෝණාස්‍ර ගණන වැඩි ය

33. ක්‍රීඩා පිට්ටනියක සරඹ සංදර්ශනයක් සඳහා ළමයි පෙළ ගස්වා ඇත. එහි එක් පේළියක ළමයි 20 ක් සිටී. එම පේළියේ පළමු ළමයාගේ සිට 10 වන ළමයා දක්වා දුර මීටර 18 නම් එම පේළියේ මුළු දිග කොපමණ විය හැකි ද?

1. 36m 2. 38 m 3. 40 m

✷ **පහත විස්තරය කියවා පිළිතුරු සොයන්න.**

- **සීනි 1 kg ක් සහ පරිප්පු 500g ක් රුපියල් 415 යි.**
- **සීනි 1 kg ක් සහ කඩල 400g ක් රුපියල් 380 යි.**
- **සීනි 1 kg ක් රුපියල් 240 යි.**
- **පරිප්පු 500g ක් හා බිස්කට් 1 kg ක් රුපියල් 475 යි.**

34. බිස්කට් 1 kg ක මිල කීය ද?

1. රුපියල් 250 2. රුපියල් 350 3. රුපියල් 300

35. කඩල 800g ක මිල කීය ද?

1. රුපියල් 320 2. රුපියල් 280 3. රුපියල් 260


36. අද ඉරිදාවකි. පෙරේදාත් පසුගිය සඳුදාත් අතර තවත් දින කීයක් තිබේ ද?

1. 1 2. 2 3. 3

37. කඩදාසි තීරුවක් දෙවරක් නමා කපා ඇති ආකාරය පහත දැක් වේ. නැමුම් ඉරි කඩ ඉරිවලින් ද කැපුම තිත් ඉරිවලින් ද දැක්වේ.



එසේ කපා දිගහැරිය විට දකින්නට ලැබෙන රූපය තෝරන්න.


1. 
2. 
3. 

38. නවංජනා ගේ බර 28 kg කි. ගයානි නවංජනාට වඩා 4 kg ක් බර වැඩි නමුත් ගුවනිට වඩා 6kg කින් බර අඩු ය. මේ අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

වැඩි > අඩු

1. නවාංජනා > ගයානි
2. ගුවනි > ගයානි
3. නවාංජනා > ගුවනි

39. මා උදෑසන ගේට්ටුවෙන් පාසලට ඇතුළුවන විට මාගේ සෙවණැල්ල මාගේ ඉදිරියෙන් තිබුණි නම්, පුස්තකාලය පිහිටා ඇත්තේ පාසල් භූමියේ කුමන දිශාවෙන් ද?



1. දකුණ
2. උතුර
3. නැගෙනහිර

40. කරකැවී ඇති ඔරලෝසු මුහුණතක් රූපයේ දැක් වේ. එහි දැක්වෙන වේලාව 6.45 නම් ''10'' සංඛ්‍යාංකය නිරූපණය කරන ඉංග්‍රිසි අක්ෂරය කුමක් ද?



1. G
2. H
3. K

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 05
II පත්‍රය

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.07.21. පෙ.ව. 08.30 සිට පෙ.ව. 09.45 *[දෙවැනි පිටුව බලන්න.*

01. පහත සඳහන් ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුමුදු , ෆාතිමා සහ අශේන් සවස්වරුවේ වෙල් යාය අසල සෙල්ලම් කරමින් සිටියහ. හදිස්සියේ ම අහස කළු වලාකුළකින් වැසී ගිය අතර තද වැස්සක් ඇද හැළුණි. නොතෙමී සිටීමට ඔවුහු කුඹුර අසල තිබූ කුඩා පැලකට දුව ගියහ. පැල තුළ සිටින අතරතුර වැස්සක් සමඟ හමාගිය සුළඟ නිසා කුරුලු කූඩුවක් බිමට වැටී ඇති බව ඔවුහු දුටුවහ. කූඩුවේ සිටි කුරුලු පැටවුන් ආරක්ෂිතව නැවත කූඩුවට තැබීමට ඔවුහු එකමුතුව කටයුතු කළහ. ටික වේලාවකට පසු වැස්ස නතර වූ අතර කුරුලු අම්මා පැමිණ පැටවුන්ට ආහාර ලබා දෙන අයුරු දැක යහළුවෝ සතුටු වූහ.

1. වෙල් යාය අසල සෙල්ලම් කරමින් සිටියේ කවුරුන් ද? .....
2. ඔවුහු කුඹුර අසල තිබූ කුඩා පැලකට දුව ගියේ ඇයි? .....
3. පැල තුළ සිටින අතරතුර ඔවුන් දුටුවේ කුමක් ද? .....
4. ඡේදයේ ඉරි ඇදි වැකිය වර්තමාන කාලයට හරවා ලියන්න.

   .....
5. යහළුවෝ සතුටු වූයේ ඇයි ? .....
6. ඡේදයේ පාපිලි තුනක් සහිත වචනයක් සඳහන් වේ. එම වචනය තෝරා ලියන්න.

   .....
7. මූර්ධජ අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. .....

02. පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

1. නයනි සහ ගීතා සාහිත්‍ය සමිතියේ දී නාට්‍යයක් ඉදිරිපත් ..... (කළෝ ය, කළා ය.)
2. මලිත් ද මම ද තරගයට ඉදිරිපත් ..... (වෙමි / වෙමු)
3. ගස වැවට යන එන අයට සෙවණ ..... (දුන්හ / දුන්නේ ය)
4. ගොවියෝ කුඹුරු වැඩ ..... (කළා ය / කළෝ ය)
5. ඇතින්න පෙරහැරේ ගමන් ..... (කළා ය /කළේ ය)

03. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

1. මොනරා පිල් විදහා නටයි.

   .....
2. පියවරු දරුවන් ආරක්ෂා කරති.

   .....

04. පහත සඳහන් එක් එක් වගන්තියේ වැරදි අක්ෂර සහිත වචන දෙක බැගින් ඇත. එම වචන දෙක පමණක් නිවැරදි කරමින් අදාළ තිත් ඉර මත ලියන්න.

1. ඔවුහු සමනොල කදු පාමුල ඉඳ ගත්හ. - ..... , ...
2. අක්කා විශිෂ්ඨ ප්‍රතිපල ලබා ගත්තා ය. - ..... , ...

05. පහත දැක්වෙන එක් එක් නාම පදය අයත්වන නාම පද වර්ගය තිත් ඉර මත ලියන්න.

1. විද්‍යාගාරය - .....

2. සීනි - .....

06. නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

1. උත්තම පුරුෂ ඒක වචන අතීත කාල ක්‍රියා පදයකි - .....(කඩමි / කැඩුවෙමි)

2. ප්‍රථම පුරුෂ අතීත කාල බහු වචන ක්‍රියා පදයකි - .....(ඇඹුණි / ඇඹූහ)

07. පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

කසුන්ත මෙහෙට එන්න පුතා ඒ පන්ති භාර ගුරුතුයමිගේ කටහඬයි

08. පහත වචන නිවැරදිව ගළපා වගන්තිය නැවත ලියන්න.

වතුර / දොළෙහි / ශබ්දය / ගලන / සිත / කළේ ය. / මගේ / අවදි

.....

09. 1. පහත සඳහන් ඉඟි වැකියේ අදහස ලියන්න.

ඇඟ බේරා ගන්නවා - .....


2. පහත සඳහන් ප්‍රස්තා පිරුළෙහි අදහස ලියන්න.

පරංගියා කෝට්ටේ ගියා වගේ.

.....

10. පහත සඳහන් පින්තූරයට අදාළ ඉංග්‍රීසි නම පන්තූරයට යටින් ඇති කොටුතුළ ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

1. 

2. 

11. පහත සඳහන් ඉංග්‍රීසි වචන නිවැරදිව ගළපා නිවැරදි වාක්‍යයක් සාදා ලියන්න.

1. am / I / bag / closing / the

.....

2. is / the / office? / Where / post

.....

12. පහත සඳහන් ඉංග්‍රීසි වචනයට අදාළ සිංහල නම තිත් ඉරි මත ලියන්න.

1. Roots - ..... 2. Hammer - .....

13. ''තුල්ලුංගල්'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.


.....

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මෙහේ සිටගන්න - .....

15. 1. පහත සනක රාමුවෙහි නිරූපිත සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.....



2. පහත සඳහන් සංඛ්‍යා ආරෝහණ ක්‍රමයට ලියන්න.

8745 , 8095 , 8145 , 8272 - .....


16. කොටුව තුළ ඇති සියලුම ඉලක්කම් භාවිතා කර සෑදිය හැකි විශාල ම සංඛ්‍යාවේත් කුඩාම සංඛ්‍යාවේත් වෙනස කීය ද? .....

6	0
9	7

17. එක් අයෙකුට දොඩම් ගෙඩි 4 බැගින් දොඩම් ගෙඩි 532 ක් බෙදා දිය හැකි සිසුන් ගණන කීය ද? .....

18. බේකරියක පාන් සෑදීමට පිටි 40 kg ක් අවශ්‍ය වේ. දැනට පිටි 12kg 450g ක් ඇත. පාන් සෑදීම සඳහා තව කොපමණ පිටි ප්‍රමාණයක් අවශ්‍ය වේ ද? .....

19. 1. පහත සඳහන් හැඩතලවලින් සෑදිය හැකි සන වස්තුවේ නම ලියන්න. .....



2. එහි ඇති ශීර්ෂ ගණන කීය ද? .....

20. පහත කොටුව තුළින් සංඛ්‍යා හතරක් තෝරා ගෙන පොදු අන්තරය 6 වන සංඛ්‍යා රටාවක් හිස්තැන මත ලියන්න.


24	29	35
47	43	50
46	41	

.....

21. පරිප්පු 3 kg 750g කින් 250g බැගින් වූ පරිප්පු මලු කීයක් සෑදිය හැකි ද? .....

22. වේදිකා නාට්‍යයක් සඳහා ගත වූ කාලය පැය 3 මිනිත්තු 20 කි. එය අවසන් වූ වේලාව පස්වරු 8.05 නම් එම නාට්‍ය ආරම්භ කළ වේලාව කීය ද? .....

23. බඳුනක තිබූ පලතුරු බීම සියල්ලම එක භාජනයකට $3l$ $750ml$ බැගින් සමානව බෝතල් 6 කට පුරවන ලදී. බඳුනෙහි තිබූ මුළු පලතුරු බීම ප්‍රමාණය කොපමණ ද? .....

24.  1. මෙම රූපයේ පාට කළ කොසෙ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....

2. එහි පාට නොකොළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....

25. 8m ක් දිග කම්බියකින් 4m 75cm ක දිග ප්‍රමාණයක් කපා ඉවත් කරන ලදී. ඉතුරු කම්බියේ දිගේ ප්‍රමාණය කොපමණ ද? .....

✷ **වෙළඳ සැලක ප්‍රදර්ශනය කර ඇති මිල දර්ශනය පහත දැක්වේ. එම මිල දර්ශනයට අනුව 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


ද්‍රව්‍ය	1kg ක මිල රුපියල්	සත
හාල්	270	00
කඩල	280	00
පරිප්පු	370	00
අල	260	00
කරවල	1200	00

26. හාල් 4kg ක් හා කරවල 250g ක් ගැනීමට ගෙවිය යුතු මුළු මුදල කීය ද? .....

27. අල 500 g ක් සහ කඩල 200g ක් මිල දී ගැනීමට රුපියල් 1000 ක මුදලක් දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද? .....

28. 14 km දුරකින් තුෂාරි 10km 50m ක දුරක් බසයෙන් ද ඉතිරි දුර පයින් ද ගමන් කරන ලදී. ඇය පයින් ගිය දුර කොපමණ ද? .....

29. සිසුන් 60 කින් යුත් කණ්ඩායමක් වඩාත් ම කැමති රසකැවිලි පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ. නමුත් අලුවාවලට කැමති සිසුන් සංඛ්‍යාව පමණක් ප්‍රස්තාරයේ ඇඳ දක්වා නැත.



1. කැවුම්වලට වඩා කේක්වලට කැමති සිසුන් ගණන කීය ද?

   .....

2. කණ්ඩායමේ සිසුන් 60 ක් සිටී නම් අලුවාවලට කැමති සිසුන් සංඛ්‍යාව ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

✷ **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. ක්ෂීරපායී සත්ත්ව කාණ්ඩයට අයත් සතුන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. ඉබ්බා , කටුස්සා , ගේ කුරුල්ලා
2. නයා , හාවා , බල්ලා
3. මීයා , ලේනා , ගවයා

31. වියගහ භාවිතා කරනු ලබන්නේ,


1. පෙදරේරු කර්මාන්තයේ දී
2. කෘෂි කර්මාන්තයේ දී
3. පතල් කර්මාන්තයේ දී

32. දඬු සිටුවීමෙන් පැළ ලබා ගත නොහැක්කේ,

1. බතල , කංකුං
2. වම්බටු, මිරිස්
3. බුලත් , මඤ්ඤොක්කා

33. ගෙවත්තට අවශ්‍ය කාබනික පොහොර සෑදීමට සුදුසු දෙයක් වන්නේ,

1. ඉඳුල්
2. පොලිතීන්
3. රබර්


34. 

මෙම උපකරණය යොදා ගනු ලබන්නේ,

1. අපිරිසිදු ජලය පිරිසිදු කර පානීය ජලය ලබා ගැනීමට ය.
2. ලුණු මිශ්‍ර ජලයෙන් ලුණු ඉවත් කිරීමට ය.
3. පෙරීමෙන් ජලය පිරිසිදු කරගත හැකි දැයි සොයා බැලීමට ය.

35. 3R සංකල්පය ලෙස හඳුන්වන්නේ,

1. භාවිතය අවම කිරීම, නැවත භාවිත කිරීම, ප්‍රතිචක්‍රීකරණය
2. ඉවත් කිරීම, අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය
3. පිළිස්සීම, බඳුන්ගත කිරීම, ප්‍රතිචක්‍රීකරණය

36. 

රූපසටහනට අනුව මෙම ක්‍රියාකාරකම මගින් ආදර්ශනය කරන්නේ,

1. දිවා කාලය සහ රාත්‍රී කාලය ඇති වන අයුරුයි.
2. සූර්යග්‍රහණය සහ චන්ද්‍රග්‍රහණය ඇති වන අයුරුයි.
3. වඩදිය සහ බාදිය ඇති වන අයුරුයි.

37. "උණ දඬු කපන තැන උණ දඬු රිකිල්ලා" මෙම කවිය අයත් වන්නේ කුමන ජනකවි වර්ගයකට ද?

1. පැල් කවියකි. 2. පතල් කවියකි. 3. පාරු කවියකි.

38. ජල රෝදයේ කරකැවීමේ වේගය වැඩි කිරීමට කළ හැකි දෙයකි.

1. ජල පහරේ වේගය වැඩි කිරීම. 2. ජල පහරේ වේගය අඩු කිරීම.
3. ජල රෝදයේ පෙති ගණන අඩු කිරීම.


39. ලේන්සුවක මල, නටුව සහ පත්‍ර මැසීම සඳහා භාවිතා කළ හැකි විසිතුරු මැහුම් ක්‍රමය වන්නේ,


1. බ්ලැන්කට් මැස්ම 2. කතිර මැස්ම 3. දම්වැල් මැස්ම


40. පදිකයින් පාර මාරු වීම සඳහා වන සංඥා පුවරුවේ රතු මිනිසා දැල් වූ විට,

1. පාර හරහා මාරුවීම කළ යුතු ය 2. පාර හරහා මාරු වීම නොකළ යුතු ය
3. පාර හරහා මාරුවීමට සුදානම් විය යුතු ය

41. දැල්වෙන බල්බය තෝරන්න.

1. 

2. 

3. 

42. කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා ගමන් කරන දුම්රිය මාර්ගය හඳුන්වන්නේ,

1. උඩරට දුම්රිය මාර්ගය 2. කැලණිවැලි දුම්රිය මාර්ගය
3. මුහුදුබඩ දුම්රිය මාර්ගය

43. වායව පරිසරයේ සැරිසරන සතුන් වන්නේ,


1. හාවා සහ ඉබ්බා 2. සමනලයා සහ ගේ කුරුල්ලා
3. ලේනා සහ ගවයා

44. ඔරුව තුළට කාන්දු වන ජලය ඉවත් කරන උපකරණය වන්නේ?
1. දියාලුව 2. හබල 3. මාදැල

45. විටමින් A බහුල ව අඩංගු ආහාර වර්ගයකි.
1. ගස්ලබු , නිවිති 2. කිරි , පේර 3. බිත්තර , කොස්

46. ජාතික කොඩියේ ඇති රතු පැහැති පසුබිමින් සංකේතවත් වන්නේ,
1. සිංහල ජාතිය නියෝජනය කිරීම 2. ජාතික අභිමානය දැක්වීම
3. ජාතීන් අතර එකමුතු බව

47. පුද්ගලයෙකු ගමන් කිරීමේ දී නිවැරදි ව පාදය තැබිය යුතු ආකාරය වන්නේ,
1. විලුඹ , පතුල, ඇඟිලි තුඩු 2. ඇඟලි තුඩු, පතුල, විලුඹ
3. විලුඹ, ඇඟිලි තුඩු, පතුල

48. 

පහත රූපයේ මලක කොටසක් දක්වා ඇත. එහි A මගින් දක්වා ඇත්තේ කුමක් ද?
1. රේණු 2. කීලය
3. කලංකය

49. **"ළමා ලියෝ මල් ගවසා වරල පිට"** යන ජන කවිය අයත් වන්නේ,
1. ලී කෙලි කවියකට 2. කුළු නැටුම්කවියකට 3. කළගෙඩි කවියකට

50. මනිස් ලෑල්ල, බුරුමය, නඟුල උපකරණ යොදා ගනු ලබන කර්මාන්ත පිළිවෙළින්,
1. කෘෂි කර්මාන්තය, වඩු කර්මාන්තය, පතල් කර්මාන්තය
2. පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය, කෘෂි කර්මාන්තය
3. වඩු කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, කෘෂි කර්මාන්තය

51. අඩුව සහිත බඳුනක පානයක් පිළිගැන්වීමේ දී බඳුනේ අඩුව,
1. පිළිගන්වන්නාගේ දකුණුපසින් පිහිටිය යුතු ය. 2. ලබන්නාගේ ඉදිරිපසින් පිහිටිය යුතු ය.
3. ලබන්නාගේ වම්පසින් පිහිටිය යුතු ය.

52. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය, ජාතික වෘක්ෂය, ජාතික පක්ෂියා සහ ජාතික ක්‍රීඩාව පිළිවෙළින් ඇති පිළිතුර,
1. නා ගස, නා මල, වලි කුකුළා, වොලිබෝල් 2. මානෙල්, නා ගස, වලි කුකුළා, වොලිබෝල්
3. නිල් මානෙල්, නා ගස, වලි කුකුළා, වොලිබෝල්

53. පළමු ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනය නොමිලේ ලබා දීම සඳහා කටයුතු කළ වීරවරයෙකි.
1. එස්. මහින්ද හිමි 2. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා
3. ආතර් සී. ක්ලාක් මැතිතුමා

54. ව්‍යාජ අනුකරණවලින් යුතු භාණ්ඩ විකුණනු ලබන්නන් පිළිබඳව දැනුම් දිය යුත්තේ,
1. පාරිභෝගික ආරක්ෂණ අධිකාරියට 2. පොලීසියට
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට

55. ලී කැටයම් සහ රූකඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන නගර පිළිවෙළින්
1. පිළිමතලාව සහ අම්බලන්තොට 2. ඇම්බැක්ක සහ අම්බලන්ගොඩ
3. කඩුගන්නාව සහ අම්බලන්ගොඩ

56. මෙම උපකරණයෙන් සිදු කරන කාර්යයක් වන්නේ,



1. යකඩ ඇණයක් සවි කිරීමට
2. ඉස්කුරුප්පු ඇණයක් ගැළවීමට
3. තහඩු සිදුරු කිරීමට

57. පහත දැක්වෙන ලංකා සිතියමේ අංක 01 හා 02 වලින් දැක්වෙන පළාත් වන්නේ,



1. උතුරු මැද පළාත හා ඌව පළාත
2. මධ්‍යම පළාත හා වයඹ පළාත
3. උතුරු මැද හා මධ්‍යම පළාත

58. දණ්ඩ චුම්බකයක ආකර්ෂණීය ගුණය ඇත්තේ,

1. ධන හා සෘණ අග්‍ර දෙකේ පමණි
2. චුම්බකයේ හරි මැද පමණි
3. උතුරු හා දකුණු අග්‍ර දෙකේ පමණි

59. කොම්පෝස්ට් බඳුනක් තුළට දැමීමට සුදුසු ද්‍රව්‍ය වන්නේ,

1. සැමන් ,පැරණි දත් බුරුසු
2. පොල්මුඩු,බිස්කට් ඇසුරුම් කවර
3. පොල් රොඩු , පිළුණු බත්

60. **''සමගිය බලය වේ''** යන කියමන මම පොත්වලින් කියවා ඇත්තෙමි. නමුත් එහි සැබෑ අර්ථය මා දැසින් ම දැක ගත්තේ පසුගිය ඉරිදා අප ගමේ පැවැත්වුණු ශ්‍රමදානයෙනි.

''අපේ ගමේ ශ්‍රමදානයෙන් දුටු ගමේ සමගිය'' යන මාතෘකාවට අදාළ ව නිර්මාණාත්මක වැකි 3ක් ලියන්න. අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු අතර උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතු ය.

1. .....

.....

2. .....

.....

3. .....

.....

අත් අකුරු සහ ඉලක්කම් පැහැදිලිව ලියා ඇත්නම් අතිරේක ලකුණු 02 පිරිනමන්න.



සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය



ප්‍රශ්න පත්‍ර අංක 05

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර
01	(3)
02	(3)
03	(2)
04	(2)
05	(1)
06	(3)
07	(3)
08	(3)
09	(1)
10	(2)
11	(1)
12	(2)
13	(1)
14	(2)
15	(3)
16	(1)
17	(3)
18	(3)
19	(3)
20	(2)

ප්‍රශ්න අංකය	පිළිතුර
21	(2)
22	(1)
23	(3)
24	(3)
25	(1)
26	(3)
27	(1)
28	(1)
29	(1)
30	(2)
31	(3)
32	(3)
33	(2)
34	(3)
35	(2)
36	(3)
37	(3)
38	(2)
39	(1)
40	(1)

PAST PAPERS WIKI